RARE

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
02 NOV 2004
UNIVERSITY OF

# පෞරුෂත්ව සංවර්ධනයෙහි ලා පඤ්චනීවරණ ප්‍රහාණය පිළිබඳ විග්‍රහාත්මක අධ්‍යයනයක්.



| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 324 |
| වර්ග අංකය | |



කඩවත්ගම පියරතන හිමි

බු:ව: 2548 වප්මස
ක්‍රි:ව: 2004 ඔක්තෝබර්

# හැඳින්වීම

මිනිස් සිතේ ක්‍රියාත්මක වන ප්‍රබල අකුසල සිතුවිලි සමුදායක් ලෙස කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ඡකුක්කුච්ච සහ විචිකිච්ඡා යන නීවරණ ධර්ම හැඳින්විය හැකිය. ඒවා මුලුමනින් ම මිනිස් සිත විනාශ කරන සිතෙහි දීප්තිය නැති කරන මිනිස් දිවිය අඳුරට හෙලා දමන ප්‍රඥාවේ ආලෝකය වසා තබන අකුසල ධර්ම රාශියක් ලෙස මිනිස් සිතේ ක්‍රියාත්මක වෙයි. උසස් පෞරුෂත්වයක් කරා ගමන් කිරීමට බලාපොරොත්තු වන පුද්ගලයා මේ ධර්ම පිළිබඳ ව අවධියෙන් සිටිය යුතුය.

මිනිස් ගැටලු දෙස විමර්ශනාත්මකව බලන ඕනෑම පුද්ගලයෙකුට පෙනී යන්නේ ඒ සියලු ගැටලු මෙම නීවරණ ධර්මයන් නිසා හටගෙන ඇති බවයි. මිනිසාට මුහුණ පෑමට සිදුවන ගැටලු පිළිබඳ ව ආගම් දර්ශනවලට මෙන් ම විවිධ විෂයක්ෂේත්‍රවලට ද අනුව අදහස් ඉදිරිපත් කර ඇත. සමාජ විද්‍යාඥයන් මිනිස් ගැටලු දෙස ඔවුන්ගේ දෘෂ්ටිකෝණවලින් බැලීමටත් මනෝවිද්‍යාඥයන් මානවවිද්‍යාඥයන් මෙන් ම අධ්‍යාපන විද්වත්හු ද ඔවුනොවුන්ගේ පරීක්ෂණවලට අනුව විවිධ අදහස් ඉදිරිපත් කළහ. ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් දෙස බලන විට මිනිසාගේ දිවිපැවැත්ම උසස් ලෙස ගත කිරීමට කරන ලද අධ්‍යයනයක් වශයෙන් පෙන්වා දියහැකිය. එසේ ම ඔවුන්ගේ අදහස් ලෞකිකත්වය පූර්ණ ලෙස ගත කිරීමට සකස් කරගත් ඒවා බව පෙනී යයි. එයට බාධක වන කරුණු මිනිස් ගැටලු වශයෙන් පැහැදිලි කර දීමට උත්සාහ දරයි. ප්‍රධාන මිනිස් ගැටලු අතර සාකච්ඡා කිරීමට උත්සාහ දරන්නේ යුද්ධය, ආර්ථික ගැටලු, ලෙඩදුක්, දේපොළ ප්‍රශ්න, ආහාර, වස්ත්‍ර, නිවාස ආදියයි. මේවා ප්‍රධාන මිනිස් ගැටලු වශයෙන් ඉතා පටු පරමාර්ථවල සිට කරන ලද ප්‍රකාශන බව බුද්ධ දේශනාව දෙස බලනවිට පෙනී යයි.

ඉහත කී ගැටලුවලට උන්වහන්සේ පිළිතුරු දුන් අතර, ඊටත් වඩා මිනිස් ගැටලු දෙස පුළුල් ලෙස බැලූහ. උන්වහන්සේ බොහෝ දෙනා නුදුටු ප්‍රධානතම මිනිස් ගැටලුව ලෙස ජාතිය හෙවත් ඉපදීම විස්තර කළහ. ඊට පසුව මුහුණ දීමට සිදුවන ජරා, ව්‍යාධි සහ මරණ යනාදිය මිනිසාට මුහුණ දීමට සිදුවන ප්‍රධානතම ගැටලු වශයෙන් පෙන්වා දුන්හ. මිනිසාට ඇති ප්‍රධානතම අභියෝග හතර මෙය බව උන්වහන්සේ ලෝකයාට ප්‍රකට කළහ. මේවා ප්‍රධාන මිනිස් ගැටලු වශයෙන් අවබෝධ කර ගැනීමත්, එම ගැටලු හටගැනීමට හේතුවත්, ගැටලු විසඳීමත් එම ගැටලු විසඳීමේ මහත් උන්වහන්සේ මැනවින් පෙන්වා දුන්හ. මෙම මිනිස් ගැටලු ලෝකයේ සදාකාලික ව පවතියි. ඕනෑම රටකට ඕනෑම ජාතියකට මෙම ගැටලු පොදු වූ ඒවාය. එබැවින් බුදුසමය ප්‍රධාන මිනිස් ගැටලු ලෙස හඳුනාගෙන ඇත්තේ සමස්ත විශ්ව ප්‍රජාවට ම බලපාන ප්‍රශ්නයි. ලෝකය වෙනස් වුව ද මෙම ප්‍රශ්න වෙනස් නොවී සදාකාලික ව ම පවතියි.

සංස්කෘතිය, පරිසරය, ජීවන රටා සියල්ල දිනෙන් දින වෙනස් වෙයි. වෙනස් වන සමාජයේ ප්‍රශ්න වෙනස් වන අතර විවිධ අවශ්‍යතාවන් මත අලුත් ගැටලු ද නිර්මාණය වෙයි. නව ප්‍රශ්න අලුත්වෙන අතර ඒවාට මිනිසා විසඳුම් සොයයි. ඇතැම් විට එම විසඳුම් සියල්ලක් ම ගැටලු ගොඩක පටලැවිල්ලක් මිස යථාර්ථ විසඳුමක් නොවන්නේය. මේ සියලු ගැටලුවලට විසඳුම් සහ ඒවා හටගැනීමට හේතු වූ මූලයන් සොයාගත් ශ්‍රේෂ්ඨයාණෝ බුදුරජාණන් වහන්සේ වූහ. උන්වහන්සේ ගැටලුවලට අවිද්‍යාවත්, තෘෂ්ණාවත් මුල්වන බව පැහැදිලි කළහ. මේ කාරණා නිසා මිනිසාට ගැටලු ගොඩක වෙලී සිටීමට සිදුවෙයි. උන්වහන්සේ මේ ගැටලු විසඳීමේ මග ආර්ය මාර්ගය බව පැහැදිලි කළහ. එම ආර්ය මාර්ගය පසක් කර ගැනීමෙහි ලා ප්‍රධානතම බාධකය ලෙස නීවරණධර්ම පෙන්වා දුන්හ. මෙම භයානක කෙලෙස් ධර්ම යථාර්ථය පසක් කිරීමට ඉඩ නො දෙයි. එය ආවරණය කරතබයි. මිනිස් ගැටලු සියල්ලක් ම මෙම නීවරණ ධර්මයන් මූලික ව පවත්නා බව ලොවට මුලින් ම පැහැදිලි කර දුන්නේ බුදුරජාණන් වහන්සේය.

නීවරණ ධර්මයන් කෙරෙහි අවධාරණයෙන් ජීවත්වීම ගැටලුවලින් තොරව ජීවත් වීමට මහත් උපකාරී වන්නේය. දෛනික ජීවිතයෙහි ඇතිවන ප්‍රශ්න අඩකටත් වඩා මෙම නීවරණ ධර්මයන් කෙරෙන් උපදියි. සියලු අකුසල ක්‍රියාවන් මෙන් ම සදාචාරාත්මක නොවන ක්‍රියාවන් සියල්ලක් ම මෙම නීවරණ ධර්මයන් පදනම් කොට ගෙන ඇත. කාමච්ඡන්ද නීවරණය ඉතා පුළුල් පසුබිමක සාකච්ඡා කෙරෙයි. නීවරණ මුල් කරගෙන පැනනගින ප්‍රශ්න සියල්ලක් ම ඒවා ප්‍රහීණ කිරීමෙන් හෝ ඒවා ගැන අවධානයෙන් සිටීමෙන් විසඳාගත හැකිය. ව්‍යාපාදය නිසා ඇතිවන වෛරය, පලිගැනීම් හිංසාවන් ආදී සියල්ලක් අතහැර ලොව දෙස මෛත්‍රී සංකල්පනා තුළින් බැලීමෙන් නැතිව යන්නේය. යුද්ධය වැනි බිහිසුණු තත්ත්වයන් මෙම ව්‍යාපාදය නිසාම හටගනියි. මෙසේ බලන විට ලොව ඇති ප්‍රධානතම ප්‍රශ්නවලට විසඳුම නීවරණ ප්‍රහාණයෙන් දුරුකර ගත හැකිය. තුන්වන ලෝකයේ ජීවත් වන වැඩි ජනගහනයකට මුහුණ පාන්නට සිදුවන දුප්පත්කම හෙවත් දරිද්‍රතාව ථීනමිද්ධ හෙවත් කයේ සහ මනසේ අලසකම දුරු කරගෙන උනන්දුවෙන් උද්යෝගයෙන් කටයුතු කිරීමෙන් දුරු කර ගත හැකිය. එසේ කිරීමෙන් ආර්ථික සුරක්ෂිතතාව ද ඇති කරගත හැකිය. සිතෙහි පවත්නා වූ නොසන්සුන්තාව සහ හොඳ නරක තේරුම් ගැනීමෙහි නුවණ, උද්ධච්චකුක්කුච්චයෙන් පැහැදිලි කරයි. මෙම තත්ත්වය අවබෝධ කර ගැනීමෙන් උසස් මනසකින් ජීවිතයට මුහුණ දිය හැකිය. කුසලාකුසල ධර්මයන් පිළිබඳ ව කිසිදු සැකයක් නො කර කටයුතු කිරීම විචිකිච්ඡාවෙන් වෙන් වීමයි.

කෙලෙස්වලින් මුලුමනින් ම ඇලී ගැලී සිටි පුද්ගලයා එයින් ගොඩගැනීමට නීවරණ ප්‍රහාණය සමත් වන්නේය. ලෞකික ජීවිතය සදාචාරයෙන් අභිමානවත් ලෙස ජයග්‍රහණය කිරීමට නීවරණධර්ම පිළිබඳ අවබෝධය හේතුවෙයි. මෙම නීවරණධර්ම මෙලොව ජීවිතය හැඩ ගැසීමට පමණක් නොව සසර පැවැත්මේ මාර්ගය හෙළිකර ගැනීමට ද මහෝපකාරී වන්නේය. ආර්ය මාර්ගයේ දී නීවරණ ප්‍රහාණයේ ඇති වටිනාකම මෙහිදී පැහැදිලි වනු ඇත.

පුද්ගලයෙකු පූර්ණ පෞරුෂත්වයක් කරා ගමන් කළ යුතු පිළිවෙළ බුදුසමය මැනවින් පෙන්වා දෙයි. පුද්ගලයා සහ පෞරුෂය යන්න වෙන් කළ නොහැක්කකි. පූර්ණ පෞරුෂත්වයක් කරා ගමන් කිරීමේ මාර්ග විවිධාකාරයෙන් විද්වත්හු කථා කළහ. ඒ අතර බුදුරජාණන් වහන්සේ මිනිසා පූර්ණ පෞරුෂත්වයක් කරා ගමන් කළ යුතු පිළිවෙළ අද්විතීය අයුරින් දේශනා කළහ. උන්වහන්සේ දේශනා කළ පෞරුෂ නිෂ්ටාව හා සම්බන්ධ කළ හැකි වෙනත් පරමාදර්ශයක් දකින්නට නැත. පුද්ගලයා ඉතාමත් සදාචාර සම්පන්නව ගත කරන ජීවිතය තුළ දර්ශනයත්, චරණයත් යන දෙක උපරිමයෙන් දියුණු කර ගත් පසුව බුදුසමයේ පරමාර්ථය වන නිවන් අවබෝධ කර ගත හැකිය.

මිනිසා නීවරණ ප්‍රහාණය තුළින් පූර්ණ පෞරුෂත්වයක් කරා ගමන් කරන්නා වූ පිළිවෙළ මෙහි සඳහන් කරයි. බුදුසමයෙහි මනස පිළිබඳ ව කර ඇති විග්‍රහය වෙනත් කිසිම ඉගැන්වීමකට සමකළ නො හැකිය. නීවරණ ධර්ම සහ පෞරුෂත්ව සංවර්ධනය පිළිබඳ අධ්‍යයනයෙන් ඒ බව මැනවින් පැහැදිලි වෙයි. මෙලොව සහ සාංසාරික ජීවිතය සැපවත් කර ගැනීම ද ලෝකෝත්තර ජීවිතය ජයග්‍රහණය කිරීම හෙවත් නිවන් ලබා ගැනීමට ද මෙම නීවරණ ප්‍රහාණය ඉවහල් වන අයුරු මෙහි පෙන්වා දෙයි.

බුදු සමය තුළ පෙන්වා දී ඇති මේ නීවරණ නැමති පිරිසිදු ධර්ම සංකල්පය විවිධ බෞද්ධ දාර්ශනික සම්ප්‍රදායයන් විසින් මෙම මතය ම ඔප්පු කිරීමට යාමෙන් ව්‍යාකුල බවට පත් කරන ලදී. මුල් බුදුසමය සමග සසඳා බලන විට එම විවේචන මතවාදයන්ට තුඩුදුන්හ. ඇතැම් අය මේවා එම සම්ප්‍රදායයන්ගේ දියුණුවට හේතු වූ දාර්ශනික ප්‍රවණතාවන් ලෙස හුවා දැක්වූහ. නමුත් සැබවින් ම සිදුවී ඇත්තේ බුදුරජාණන් වහන්සේ දේශනා කළ මුල් බුද්ධ මතය යටපත් වීමයි. එය බුදුසමයේ ධර්ම සංකල්පවල පරිහානියකි. මහායාන සම්ප්‍රදායෙන් අලංකාර වූ ශ්‍රී ලාංකික අභය ගිරිකවාදීහු ද ඇතැම් දහම් කරුණු ඔවුන්ගේ මතයන් ඔප්පු කර ගැනීමට පිටුබලයක් කිරීමට යාමෙන් විකෘති කළහ. ථේරවාදීහු ඔවුන්ට නිසි පිළිතුරු දුන්හ.

අභයගිරිකයෝ නීවරණ ධර්මවල එන මිද්ධය රූප ධර්මයන්ට එකතු කළහ. එහෙත් ඔවුන්ගේ එවැනි ප්‍රබල මතයන් පවා ඛණ්ඩනය කොට මහාවිහාරිකයෝ මුල් බුද්ධ මතය ආරක්ෂා කර ගත්හ. ඉන්දියාවේ බිහි වූ අනිකුත් බෞද්ධ දර්ශන සම්ප්‍රදායයන් අභිබවා ලාංකීය ථේරවාදී සම්ප්‍රදාය ධර්ම සංකල්ප දියුණු කිරීමත් මුල් බුදුසමය ආරක්ෂා කිරීමටත් මහඟු දායකත්වයක් ලබාදුන් අයුරු මෙයින් ප්‍රකට වෙයි. ලාංකීය ථේරවාදී භික්ෂූන් වහන්සේලා මුල් බුදුසමයේ ආරක්ෂාවටත් දියුණුවටත් දැවැන්ත මෙහෙයයක් ඉටු කර ඇති බව ලෝකයාට මෙමඟින් ප්‍රකට කළ හැකිය.

– – –

කඩවත්ගම පියරතන හිමි,

ශ්‍රී බෝධිරුක්ඛාරාමය,

වරාගොඩ,

කැලණිය.

2004–10–10